28 *"කිං සීලං ති? චෙතනා සීලං, චෙතසිකං සීලං, සංවරො සීලං, අවිතික්කමො සීලං"* - ශ්‍රී ධර්මවංශ හිමි, මාතර (සිංහල අනුවාදය), බු.ව. 2503, විශුද්ධි මාර්ගය, ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම, බණ්ඩාරගම, පි. 8.

29 එම, පි. 11.

30 එම, පි. 14.

31 *"චරන්ති කස්මිං සීලෙ පරිපූර කාරිතාය පවත්තතන්තී'ති චාරිත්තං."* - එම, පි. 15.

32 *"චාරිතං තායන්ති රක්ඛන්ති තෙනාති චාරිත්තං."* - එම, පි. 15.

33 *"සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා*
*සචිත්ත පරියොදපනං ඒතං බුද්ධාන සාසනං* - බුද්දකපාඨ, ධම්මපදපාලි, බු. ජ. ත්‍රි. (පුනර්. මු.), බුද්ධ වග්ගය, 183 ගාථාව.

34 දීඝනිකාය 1, සෝණදණ්ඩ සූත්‍රය, බු. ජ. ත්‍රි. (පුනර්. මු.), පි. 243.

35 මේධානන්ද හිමි දේවාලේගම, ධම්මරතන හිමි තැරැලේ, ගාමිණී විජේසිංහ ඩබ්. ඒ, බෞද්ධ සංස්කෘතිය (පසුබිම හා මූලධර්ම), 2011, කතෘ ප්‍රකාශනය, කොලිටි ප්‍රින්ටර්ස්, නුගේගොඩ, පි. 156.

36 මජ්ඣිම නිකාය. 2, කුක්කුරවතිය සූත්‍රය, බු.ජ.ත්‍රි. (පුනර්. මු.), පි. 84.

37 එම.

38 දීඝ නිකාය 2, සිඟාල සූත්‍රය, බු.ජ.ත්‍රි. (පුනර්. මු.), පි. 309.

39 එම.

*40* *"ගිහීනං ච චෙතියවන්දනත්ථාය ගච්ඡාම, බෝධිවන්දනත්ථාය ගච්ඡාම, ධම්මසවනං කරිස්සාම දීපමාලා පුප්ඵපූජා කරිස්සාම... දස්සාම, අජ්ජ සඞ්ඝස්ස චත්තාරො පච්චයෙ දස්සාම, සඞ්ඝං නිමන්තෙත්වා ඛදනීයභොජනීයාදීනි සංවිදහථ, ආසනානි... මෙත්තං වචීකම්මං නාම"* - ධම්මකිත්ති සිරි දේවමිත්ත හිමි(සංස්.), හෙයියන්තුඩුවේ, 1918, සුමංගලවිලාසිනි, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, පි. 366.

41 හේවාමානගේ විමල්, බෞද්ධ පූජාචාරිත්‍ර හා සාහිත්‍යය, පි. 42.

42 ආනන්ද මෛත්‍රී හිමි බලංගොඩ (සංස්.), 1962, මිළින්දපඤ්හො, අනුල මුද්‍රණාලය, මරදාන, පි. 160.

43 රාහුල හිමි වල්පොළ, 1997, සත්‍යෝදය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, පිටු. 11, 15, 17.

44 හේවාමානගේ විමල්, බෞද්ධ පූජාචාරිත්‍ර හා සාහිත්‍යය, පි. 36.

45 එම, පි. 48.

46 විමලරතන හිමි, බෙල්ලන්විල, ත්‍රිවිධ චෛත්‍ය වන්දනා (ලිපිය), රාහුල හිමි කොටපිටියේ (සංස්.), බුදුසමය හා පූජා චාරිත්‍ර, පි. 91.

47 *"පූජාරහේ පූජයතෙ බුද්ධෙ යදි ච සාවකෙ - පපඤ්ච සමතික්කන්තෙ තිණ්ණසොක පරිද්දවෙ"*
*"තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ - න සක්කා පුඤ්ඤං සංඛාතුං ඉමෙත්ථම්පි කෙනචි"*
බුද්දකපාඨ, ධම්මපදපාලි, බු.ජ.ත්‍රි. (පුනර්. මු.), 195, 196 ගාථා.

48 මේධානන්ද හිමි දේවාලේගම, ධම්මරතන හිමි තැරැලේ, ගාමිණී විජේසිංහ ඩබ්.ඒ, බෞද්ධ සංස්කෘතිය (පසුබිම හා මූලධර්ම), පි. 145.

# සංශයවාදය හා ආදි බෞද්ධ චින්තනය අතර සමානතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**

Since extreme skepticism questions all knowledge, it played a significant role in the history of philosophy in the development of epistemology. Skepticism is a philosophical attitude that questions people's claims to knowledge. It is usually backed by epistemological reasons. The Pāli canonical sources do not provide much information regarding the epistemological reasons for skepticism in Indian thought. Some scholars have expressed the opinion that the teachings of the skeptics mentioned above have had an influence on Buddhism. However Buddhism is not a skepticism. But skeptic thought is not redetected by Buddhism. Knowledge was considered in Buddhism as a pre-requisite to the attainment of Nibbāna. One cannot attain it without overcoming skeptical doubt and perplexity regarding the truths of Buddhism pertaining to the nature of life, the world and morality. Thus we see that the Buddha admitted the possibility of knowledge regarding many issues on which the skeptics denied any such possibility. Hence, this research article will discuss the similarities of skepticism and early Buddhism with comparatively.

## ප්‍රවේශය

කිසිදු යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් වැළකීම, විමර්ශනාත්මක අභිරුචිය රැගත් සංශයවාදී මූලික ස්ථාවර පෙර'පර දෙදිගයෙන් ම වෙනසකින් තොර ව පිළිගෙන ඇත. මේ අනුව සංශයවාදී චින්තනය කවර දර්ශනය සම්ප්‍රදායකින් ඉදිරිපත් වුවත්

© **කථිකාචාර්ය දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රපඤ්ච මනුෂ්‍යයාට වාස්තවික, විෂය මූලික, සර්ව සම්පූර්ණ ඥානයක් ලබා ගත නොහැකි බව[1] මූලික ස්ථාවරය ලෙස ගෙන හැර දැක් වූ බව පෙනේ. බටහිර සංශයවාදයේ අග්‍රතම ඵලය වූ පයිරෝනියානු සංශයවාදීන්ට අනුව සාමාන්‍ය හෝ විශේෂිත යන ද්වාවිධ වස්තූන්ගේ පැවැත්ම පිළිබඳ ස්ථාවර නිගමනයකින් හෝ නිශ්චිත අදහසකින් බැලීම නිරවද්‍ය ඥානය සඳහා නිෂ්ඵල ක්‍රියාවකි. සැක සහිත අවිනිශ්චිත බවකින් විමසීම, ධර්ම පිළිබඳ සත්‍ය දැනුම හෝ විශේෂ ක්ෂේත්‍රයක් තුළ දැනුමේ පවත්නා ස්ථාවරත්වය ප්‍රතික්ෂේප කර අස්ථාවරත්වය ගෙනහැර දැක්වීම යන කරුණු වැදගත් බව ඔවුන්ගේ අදහස යි. මේ සඳහා තීන්දු තීරණ අහෝසි කිරීම, ක්‍රමබද්ධ සැකය හෝ විවේචන ඉදිරිපත් කිරීම ප්‍රගුණ කළ යුතු බව පයිරෝනියානු සංශයවාදීහු පෙන්වා දුන්හ. පෙරදිග දාර්ශනිකයන්ගෙන් සංශයවාදීන් ලෙස ගැනෙන අමරාවික්ඛෙපවාදීන් සදාචාරාත්මක අංශය කෙරේ නැඹුරු වෙමින් හා අඥානභාවය ප්‍රකට කරමින් සත්‍යාන්වේෂණය කළ නොහැකි දෑ පිළිබඳ සිය සංශය මෙහෙයවා ඇත. සංශයවාදය පිළිබඳ බෞද්ධ ස්ථාවරය තුළ සංශයවාදය හා බුදු දහම සම විෂම වන අයුරු සලකා බැලිය හැකි අතර මෙම ශාස්ත්‍රීය ලිපියේ අරමුණ වන්නේ සංශයවාදය හා බුදු දහම අතර සමානතා අධ්‍යයනය කිරීම යි.

### සංශයවාදය හා බුදු දහම අතර පවත්නා සමානතා

පෙර අපර දෙදිග සංශයවාදී චින්තනය සලකා බලන විට එය බුදු දහම සමග බොහෝ සෙයින් තුලනය වන ලක්ෂණ කිහිපයක් දැකිය හැකි ය. ඒවා නම්,

1. සංශයාත්මක පෙළඹීමක් මත විමර්ශනාත්මක අභිරුචිය අවධාරණය කිරීම.
2. අන්තවාද බැහැර කිරීම.
3. සදාචාරාත්මක නැඹුරුව
4. මනෝභාව පිළිබඳ මධ්‍යස්ථතාව
5. වාදශීලී බව ප්‍රතික්ෂේප කිරීම.
6. ව්‍යාජ, ප්‍රෝඩාකාර හා ගුඪ මතවාද බැහැර කිරීම.
7. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ දුබලතා පෙන්වා දීම.



8. සර්ව සම්පූර්ණ ඥානය ප්‍රතික්ෂේප කිරීම.
9. ඥානයෙහි සීමාවලින් ඔබ්බට යාමෙහි අනවශ්‍ය බව පෙන්වා දීම යනාදිය යි.

### 1. සංශයාත්මක පෙළඹීමක් මත විමර්ශනාත්මක අභිරුචිය අවධාරණය කිරීම

සංශයාත්මක දර්ශනයේ දක්නට ලැබෙන මූලික ලක්ෂණයක් වනුයේ විමර්ශනාත්මක අභිරුචිය යි. අන්ධ භක්තියෙන්, ආධානග්‍රාහීත්වයෙන් යමක් එසේ යැයි පිළිගැනීමට වඩා යටත් පිරිසෙයින් සැකයක් උපදවා ගැනීම හෝ පිළිබිඹු කරන්නේ නම් එහි වැදගත්කමක් ඇත. දර්ශනයේ මාතාව සැකය යි. මෙතෙක් බිහි වූ සෑම චින්තනයක ම සමාරම්භක අවස්ථාව නැතහොත් මූලාරම්භය සොයා ගියහොත් අප නතර වනුයේ එතෙක් පැවති චින්තන සම්ප්‍රදායයන් පිළිබඳ උපදවා ගන්නා ලද සැකයක් හමුවෙහි ය.[2] ''මෙය මෙලෙස වීම විය හැකිද?, මෙය වෙනත් අයුරකින් සිදුවිය නොහැකිද?'' යනුවෙන් විමර්ශනය දිරිගැන්වීම සඳහා සංශයෙහි කාර්යභාරය අතිශය ප්‍රබල ය. බටහිර දර්ශනය තුළ ග්‍රීක යුගයේ පටන් ම බාහිර ලෝකය පිළිබඳවත්, මිනිස් අභ්‍යන්තරය පිළිබඳවත් පැවති සංශය නිසා නොයෙක් දාර්ශනිකයන් විවිධ චින්තාවන් ඉදිරිපත් කළ බව පෙනේ. චින්නඹුවකගේ කාර්ය හා සමාන ව ජීවිතය පිළිබඳ නොයෙක් චින්තාවන් ඉදිරිපත් කරමින් හා අන්‍යයන් තුළින් ඥානය මතු කරමින් විමර්ශනාත්මක අභිරුචියකින් තනන ලද ප්‍රායෝගික සංශයක් සොක්‍රටීස් විසින් දැරූ බව පෙනේ. මධ්‍යතන යුගයේ දේවවාදී යදම්වලින් ඥාන විභාගය සිර කොට තැබීම අපහසු වූයේ ද මෙම විමර්ශනාත්මක අභිරුචිය යි. නූතන බටහිර දර්ශනයේ ඥාන ගවේෂණය පිළිබඳ බුද්ධිවාදය හා අනුභූතිවාදය පිළිබඳ මතවාද ගොඩනැගුණේ ද මෙහි ප්‍රතිඵලයක් ලෙස යි.

දෙවියන් පිළිබඳ භක්තිය ජනිත කිරීමට අවශ්‍ය පසුබිම අබිබවා සිත්සතන්වලින් පැන නැගුණ සංශයාත්මක අදහස් භාරතීය දර්ශනයේ ආදිතම යුගය වන වෛදික යුගයේ රචිත ඍග්වේදය තුළින් ද මතු වේ. වෛදික චින්තාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා ම සංශයාත්මක අභිරුචිය අළුයට සැඟවුණු ගිනි පුපුරු මෙන් වරින් වර මතු වූ අතර එය අවෛදික චින්තනයට ද මහත් වූ

බලපෑමක් සිදු කළේ ය. විශේෂයෙන් ම මෙම විමර්ශනාත්මක අභිරුචිය මත ලෝක යථාර්ථය අවබෝධ කර ගැනීමෙහි ලා අතිවිශාල ශ්‍රමණ සම්ප්‍රදා රැසක් නා නා ප්‍රකාර විමුක්ති මාර්ග ගෙනහැර දැක්වුව ද, එහි උපරිම ඵල නෙලා ගැනීමට සමත් වූ සුවිශේෂ ශාස්තෘවරයෙකු[3] වන්නේ බුදුරජාණන්වහන්සේ ය.

බුදු සමයෙන් පැනෙන විමර්ශනාත්මක අභිරුචිය කෙරේ අපගේ අවධානය තෙවැදෑරුම් පරිදි යොමු කළ හැකි බව පෙනේ. එනම්,

I. බුද්ධ චරිතයෙන් පැනෙන විමර්ශනාත්මක අභිරුචිය
II. බුද්ධ දේශනාවන්ගෙන් ප්‍රකට වන විමර්ශනාත්මක අභිරුචිය
III. බුද්ධ ශ්‍රාවකයන්ගෙන් ප්‍රකට වන විමර්ශනාත්මක අභිරුචිය

යනාදිය යි.

## I. බුද්ධ චරිතයෙන් පැනෙන විමර්ශනාත්මක අභිරුචිය

අභියෝගාත්මක අවස්ථාවල දී පවා විමර්ශනාත්මක අභිරුචිය ජය ලබා ගැනීමට උපයෝගී වන බව බෝසත් චරිතය තුළින් නිරූපණය කෙරෙන ආකාරය අපණ්ණක, ථේලපත්ථ[4] හා වණ්ණුපථ[5] ආදී ජාතක කතාවලින් පෙනෙන අතර කුඩා අවදියේ පටන් ශාස්ත්‍රීය[6], වෘත්තීය හා ආධ්‍යාත්මික[7] අංශ කෙරේ විමර්ශනයක යෙදුණු ආකාරය මූලාශ්‍රයවලින් පැහැදිලි වේ.

සිදුහත් තරුණයා සාම්ප්‍රදායික සමාජ රටාව නම් වූ තිමිර පටලයෙන් වසන් කර තිබූ මනුෂ්‍ය ජීවිතයෙහි ප්‍රායෝගික හරය පිළිබඳ ප්‍රශ්න කරමින් දැන ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරුවේ ය. සමාජ යථාර්ථය විනිවිද දැකීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වූයේ සෑම දෙනා ම ජරාවටත්, රෝගාතුර භාවයටත්, මරණයටත් පත් වන ධර්මතා දැක තමන් ද එය නොඉක්ම වූ තැනැත්තෙක් යැයි සිතුවේ ය. ජීවිතයේ හරය, ලෝකයේ සත්‍යය සොයා තවුස් ජීවිත ගත කළ නිගණ්ඨ, ආජීවක, පරිබ්‍රාජක, ආදී බොහෝ පිරිස් ද, එතුමාට දක්නට ලැබුණු අතර ඔවුන්ගේ ඉගැන්වීම් හා විමුක්ති මාර්ග පිළිබඳ ව ද ප්‍රමාණවත් අවබෝධයක් ලැබ ගත්තේ ය.[8] මේ අනුව ගිහිගෙය සම්බාධක සහිත බවත්, කෙලෙස්වලට ආයතනයක් බවත්, පැවිද්ද හිස් අභ්‍යාවකාශය මෙන් නිදහස් බවත්[9] දැක ස්වකීය ප්‍රධාන



උත්සාහය සඳහා අභිනිෂ්ක්‍රමණයෙහි වැදගත්කම[10] අවබෝධ කරගත්තේ ය. සිදුහත් තවුසාගේ මූලික අභිප්‍රාය වූයේ යහපත කුමක්ද? යන්න ගවේෂණය කිරීම (කිං කුසල ගවේසී)[11] හෙවත් අනුත්තර උතුම් ශාන්තියට මඟ සෙවීමකි. (අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො)[12] ජීවිතයේ පරමාර්ථය ගවේෂණය කිරීමෙහි සිද්ධාර්ථ තවුසාණන්ගේ මෙම ව්‍යායාමය උතුම් පර්යේෂණය නොහොත් ආර්ය පර්යේෂණය (අරිය පරියේසනා)[13] නම් විය. මේ සඳහා සිදුහත් තවුසා, ආලාරකාලාම, උද්දකරාමපුත්‍ර යනාදී එවකට සුප්‍රකට ගුරුවරු වෙත ගියේ ය.[14] නේවසඤ්ඤා නාසඤ්ඤා ධ්‍යානය දක්වා සිත දියුණු කර ගැනීමට හැකි වුවත් වෙනස් නොවන, පරම සැපතක් එහි නොවූ බැවින් උග්‍ර තපස් රැකීමෙන් හෝ පරම ශාන්තිය සාක්ෂාත් කර ගැනීමෙහි විමර්ශනය අත්නොහළේ ය. කෙතරම් තීව්‍ර (තිප්ප), කටුක (කටුකා), දුක් වේදනා විඳිමින් (වේදනා වේදයන්ති) දුෂ්කර ක්‍රියාවල නිරතවුව ද උත්තරීතර මනුෂ්‍ය ධර්මය වන ආර්යභාවය ගෙනදීමට සමර්ථ ඥාන දර්ශනයක් නොමැති බවත්, සම්බෝධිය පිණිස වෙනත් මඟක් ඇති බවත්[15] සිය විමර්ශනයෙන් ම අවබෝධ කර ගත් සිදුහත් තවුසා නැවතත් ශරීර ශක්තිය නගා ධ්‍යාන කෙරේ අවධානය යොමු කළේ ය. එහිදී පුබ්බේනිවාසානුස්සති ඥානයත්, දිබ්බ චක්ඛු ඥානයත්, ආසවක්ඛය ඥානයත් පෙර නොඇසූ විරූ ලෙස (පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු) තමන් විසින් ම දැන (සයං අභිඤ්ඤා සච්ඡිකත්වා) සිය ආර්ය පර්යේෂණය නම් වූ දැවැන්ත උත්සාහයේ ප්‍රතිඵලය වන ආර්ය සත්‍ය අවබෝධ කර ගත්තේ ය. ඒ බව බුදුන්වහන්සේ සිය උදාන වාක්‍යයකින් මෙසේ ගෙනහැර දක්වති.

> ''පුබ්බෙ අනනුස්සුතේසු ධම්මේසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි''[16]

## II. බුද්ධ දේශනාවන්ගෙන් ප්‍රකට වන විමර්ශනාත්මක අභිරුචිය

විමසීම (quest) යන ශබ්දයෙහි නිරුක්තිය වීමංසා යන්න යි. √මාන ධාතුවට 'වි' උපසර්ගය පූර්ව වී ඇති මෙහි ''මාන'' යන්න වෙනුවට ''මං'' යන්න ආදේශ වී[17] ''වීමංසාය'', ''වීමංසති'' යනාදී ලෙස නාම, ක්‍රියා පදවල යෙදෙන බව පෙනේ. එහි පදගතාර්ථය පරීක්ෂා කිරීම, නුවණින් බැලීම[18] යනාදිය යි. වීමංසනයට මුල් වන්නේ සැකය නම් වූ මූලික මනෝභාවය යි. සැකය නොහොත්

සංශය, සත්‍ය ගවේෂණයේ ප්‍රධාන මෙවලම බව ඉහතදී ද සාකච්ඡා විය. මේ අනුව සැකයක් ඇති වූ විට එම සැකය පිරිසිඳ දැන ගැනීමට දරන උත්සාහය වීමංසනය නම් වන බව දැක්විය හැකි ය.[19] අන්ධානුකරණය, අන්ධ භක්තිය බැහැර කොට විවෘත, විචාරාත්මක මනසකින් යමක් දෙස බැලීමට උත්තේජනයක් වීමංසනය තුළින් මතුවන ආකාරය මේ මගින් පැහැදිලි වන අතර එය ස්වච්ඡන්දතාවයේ (free will) ඉහළතම ප්‍රතිඵලයක් බව පෙනේ.

සියලු දුක් නැති කොට නිර්වාණය නම් වූ උතුම් සත්‍ය අවබෝධ කර ගැනීමෙහි ලා විමර්ශනාත්මක අභිරුචියේ වැදගත්කම බුදුරදුන් සූත්‍ර දේශනා ගණනාවකින් ම පෙන්වාදී ඇත. යමක් නුවණින් විමසා බලා, පරීක්ෂා කර බලා අවබෝධ කර ගැනීම'[20] යන්න අවධාරණය කිරීමට බුදු සමය වීමංසනය' යන පදය බහුලව යොදා ඇත. එහි පරමාර්ථය වන්නේ කිසිවිටෙකත් යමක් ආධානග්‍රාහී ව නොගැනිය යුතු බව පෙන්වාදීම යි.[21] පෙළෙහි වීමංසා' යන්න සඳහා විචය, පච්චය, උස්සාහනා, තුලනා, උපරිපක්ඛනා යනාදී පද මෙන් ම පඤ්ඤා යන්න ද පර්යායක් ලෙස දක්වා තිබේ. චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමේ ප්‍රඥාව ම වීමංසනය වන බව දක්වා තිබීමෙන් එය පැහැදිළි වේ. (වීමංසාතිඃ චතුසච්ච ධම්ම විචිනනා පඤ්ඤා ව)[22] වීමංසනය තුළින් අප සිදු කළ යුත්තේ යමක් අපට කෙලෙසකින් ගැළපේද? නොගැළපේද? යන්න සොයා බැලීම යි. (අයං පුච්ඡා සුත්තේසු නසුජ්ජාති යා තත්ථ වීමංසා)[23] නුවණැති මිනිසුන් විමර්ශනයෙන් යුත් අනුචින්තන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු බවත් (අනුවිච්ච කාරං ඛො සීහ කරොහි අනුච්චිචකාරො තුම්හා දිසානං ඤාත මනුස්සානං සාධු හෝති ති),[24] ක්ෂණික තීන්දු තීරණවලට වඩා සිතාමතා විමසා බැලීමෙන් කටයුතු කිරීමේ වැදගත්කමත් (අනුවිච්චි කාරකං ඛො ගහපති කරොහි අනුවිච්චිකාරො තුම්හා දිසානං ඤාත මනුස්සාසනං සාදු හෝති තී)[25] බුදුරදුන් පෙන්වාදී තිබේ. එසේ ම අප යමක් වීමංසනයට භාජනය කළ යුත්තේ දියට බැසීමට යන පුරුෂයෙක් පළමු කොට ම යෂ්ඨියකින් ජලයේ ගැඹුර විමසා බලා පසුව දියට බැස තරණය කරන්නේ යම් සේ ද, ඒ අයුරිනි. (යථා පුරිසෝ යට්ඨියා උදකං වීමංසිත්වා ඕතරති)[26] මේ සඳහා තවත් වැදගත් උපමාවක් වන්නේ ඇතාගේ විමසීමේ ක්‍රමවේදය යි. ඇතා විමර්ශනය කරන්නේ හොඬ



උපයෝගී කරගෙන ය. (හත්ථි නාගස්ස අග්ග සොණ්ඩා වීමංසා)[27] ඇතා යම් ආහාරයක් ලැබුණු විට එය අනුභව කිරීමට ප්‍රථමයෙන් එහි තද බව, මෘදු බව හා කෑ යුතු හෝ නොකෑ යුතු බව විමසයි. ආහාරයට ගත හැකි දේ පමණක් ගෙන බැහැර කළ යුතු දේ බැහැර කරයි. එපරිද්දෙන් ප්‍රඥාවන්තයා ද යහපත අයහපත නිශ්චය කර ගත යුත්තේ විමසීමෙනි. විමර්ශනය පෙරදැරි කොට ගත් ප්‍රඥාවන්තයා සසඳා බලා, තුලනය කොට ශාස්වත, උච්ඡේද ආදී අන්තවාද ඉවත් කරන[28] අයුරු නිද්දේසයේ දී ද පෙන්වාදී තිබේ. ධර්මය මෙන් ම අවශ්‍ය නම් තථාගත සම්බුද්ධත්වය වුව ද විමර්ශනය කොට කරුණු අවබෝධ කර ගැනීමට ඇති හැකියාව ද බුදුරදුන් වීමංසක සූත්‍රයේ දී පෙන්වාදී ඇත. (වීමංසකේන භික්ඛවෙ භික්ඛුනෝ පරස්ස චේතොපරියාය, අජානන්තේන තථාගතේ සමන්නේසනා, කාතබ්බා සම්මා සම්බුද්ධො වා නෝවා ඉති විඤ්ඤායති)[29]

බුදු සමය ප්‍රාමාණික විමසීමෙහි වැදගත්කම අවධාරණය කරයි. යමක් පිළිබඳ විමසීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු සතරක් දක්වා තිබීමෙන් මේ බව පැහැදිලි වේ.

- **න ච අතිලීනා භවිස්සති**
  (විමසීම අනවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු නොවිය යුතු ය.)
- **න ච අතිපග්ගහිතා භවිස්සති**
  (අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් විමසීම නොකළ යුතු ය.)
- **න ච අජ්ඣත්තං සංඛිත්තා භවිස්සති**
  (විමසීම සිත ඇතුළේ හැකිළීමට ඉඩ නොදිය යුතු ය.)
- **න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති**
  (විමසීම බාහිරව විසිරීමට ඉඩ නොදිය යුතු ය.)[30]

බුදු සමය වීමංසන සංකල්පය කෙරේ දක්වන ප්‍රතිජානන ආකල්පය විශද වන වැදගත් අවස්ථාවක් ලෙස මහා පරිණිබ්බාණ සූත්‍රයේ සතර මහාපදේශ දේශනාව හදුන්වා දිය හැක. යමෙක් මෙය ධර්මය යැයි ද මෙය විනය යැයි ද මෙය ශාස්තෘන් වහන්සේගේ දේශනාව යැයි ද භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සිට මා විසින් අසන ලද්දේ යැයි ද පිළිගන්නා ලද්දේ යැයි ද කියන්නේ නමුදු (බුද්ධාපදේශ),[31] තෙරනමක හමුවෙහි සිට මා විසින් අසන ලද්දේ යැයි ද පිළිගන්නා ලද්දේ යැයි ද කියන්නේ නමුදු (සංඝාපදේශ),[32]

බහුශ්‍රැත, ධර්මධර, විනයධර, මතිකාධර, භික්ෂූන් ශාස්තෘන් වහන්සේගේ දේශනාව මේ යැයි ප්‍රකාශ කරනු මා විසින් අසන ලද්දේ යැයි ද පිළිගන්නා ලද්දේ යැයි ද කියන්නේ නමුදු (සම්බහුලත්ථේරාපදේශ),[33] බහුශ්‍රැත, ධර්මධර, විනයධර, මතිකාධර, භික්ෂුවක් ධර්මය, විනය හා ශාස්තෘන් වහන්සේගේ දේශනාව මේ යැයි ප්‍රකාශ කරනු මා විසින් අසන ලද්දේ යැයි ද පිළිගන්නා ලද්දේ යැයි ද කියන්නේ නමුදු (ඒකත්ථේරාපදේශ),[34] එකවර ම නොපිළිගත යුතු ය. සූත්‍රයෙහි බහා වනයෙහි සසඳා බලා ගැළපේ නම් පමණක් පිළිගත යුතු ය. නොගැළපේ නම් බැහැර කළ යුතු ය.[35] අවිචාරවත්, අන්ධ භක්තිය පදනම් කරගත් පිළිගැනීම ආමූලිකා ශ්‍රද්ධා' නම් වේ. බුදු සමයෙන් එය ප්‍රතික්ෂේපිත ය. කරුණු නිස ලෙස සොයා බලා විමසා විචාර පූර්වක ව, සහේතුක ව ඇති කරගත් පිළිගැනීම ආකාරවතී ශ්‍රද්ධා' නම් වේ. බුදු සමයෙන් එය අගය කෙරේ.[36]

## III. බුද්ධ ශ්‍රාවකයන්ගෙන් ප්‍රකට වන විමර්ශනාත්මක අභිරුචිය

බුදුන් වහන්සේ අනුමත කළ හෙවත් දේශනා කළ විමර්ශනාත්මක අභිරුචිය ශ්‍රාවකයන් තුළින් ද ප්‍රකට විය. මේ සඳහා සැරියුත් මුගලන් තෙරවරුන්ගේ චරිතාපදාන වැදගත් වේ.[37] ඉගෙන ගත යුතු දෑ සියල්ල සංජයගෙන් දැන ගත්ත ද එහි පරම නිෂ්ඨාවක් නොපවතින බව දැන නැවතත් සත්‍ය සෙවීමේ දී ප්‍රසන්න පැවැත්මක් ඇති අස්සජි හිමිගෙන්[38] හේතුඵල දහම පිළිබඳ සංක්ෂිප්ත දේශනාවක් අසා[39] සෝවාන් වූහ. ඉන් අනතුරු ව බුදුන්වහන්සේගේ අග්‍රශ්‍රාවකයෝ වීමට පවා සැරියුත්, මුගලන් තෙරවරු සමත් වූහ.

එක්තරා සුවිශේෂ ප්‍රස්තුතයක් පිළිබඳ විමර්ශනාත්මක අභිරුචියකින් යුක්ත වූ බුද්ධ කාලීන භික්ෂුවක් එම විමර්ශනය අප්‍රතිහත කැපවීමෙන් සිදුකළ අයුරු කේවඩ්ඩ සූත්‍රයේ සඳහන් වේ. එම භික්ෂුවගේ අභිප්‍රාය වූයේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූත කොතැනින් නිරුද්ධ වෙත්ද? යන්න (කත්ථ නු බො ඉමෙ චත්තාරො මහා භූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවි ධාතු, අපෝ ධාතු, තේජෝ ධාතු වයොධාතුති?)[40] සොයා බැලීම යි. සිය මානසික ශක්තිය වඩමින් බ්‍රහ්මකායික දෙවියන් දක්වා ම ගමන් කිරීමට එම භික්ෂුවට සිදු විය. එම පැනයට පිළිතුරු තමන් ද නොදන්නා බවත් (අහම්පි බො න ජානාමි), මෙය විසඳා ගැනීමට සිටින එක ම සුදුස්සා බුදුරජාණන්වහන්සේ බවත් පෙන්වා



දුන් විට එම භික්ෂුව බුදුරදුන් වෙත පැමිණ නිසි පිළිතුර ලබා සිය විමර්ශනය සාර්ථක කර ගත්තේ ය.[41]

## 2. අන්තවාද බැහැර කිරීම.

ඥානය තේමා කොට ගෙන ඉදිරිපත් වී ඇති ඇතැම් චින්තන හා මත සංශයවාදීන් අන්තවාද ලෙස බැහැර කර දමයි. පෙර අපර දෙදිග සංශයවාදීන් අන්තවාද කෙරේ ප්‍රතිචාර දක්වන අයුරු එක හා සමාන නොවන බව පැහැදිලි කරුණකි. චතුර ලෙස බිණීමේ හා ලිවීමේ හැකියාව ඇතිව සංශයාත්මක දර්ශනය යම් ආකාරයකට ගෙන ගිය ග්‍රීක විතණ්ඩවාදීන් ද, ඊට හාත්පසින් වෙනත් මගක් අනුගමනය කළ පයිරෝනියානු සංශයවාදීන් ද අන්තවාද කෙරේ ප්‍රතිචාර දක්වා ඇත්තේ නිර්දය ලෙස ඒවා විවේචනය කරමිනි. ගෝලීය සංශයවාදයේ පියා වූ රෙනේ දේකාත් සමකාලීන ආධානග්‍රාහී මත විවේචනය කිරීමට සංශයවාදී අදහස් භාවිතා කළේ ය. අපරදිග සංශයවාදීනට වඩා භාරතීය සංශයවාදීන් ලෙස ගැනෙන අමරාවික්ඛේපවාදීන් අන්තවාද කෙරේ ප්‍රතිචාර දැක්වීමට වෙනස් මුහුණුවරක් භාවිත කළ බව පෙනේ. විශේෂයෙන් ම එය විවේචනාත්මක ප්‍රවේශයකට වඩා සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමයක් ලෙස ගැනීම නිවැරදි ය. තම ඥානයෙහි සීමාවෙන් ඔබ්බෙහි හෙවත් සත්‍යාපණය කළ නොහැකි දේ පිළිබඳ නිශ්චිත අදහසක් පළ කිරීම බොහෝ දෝෂ පැන නැගීමට (බහුතර දෝෂ සම්භවත්) හේතු වන බව ඔව්හු ගෙනහැර දැක්වූහ.

මේ අනුව බලන විට බටහිර සංශයවාදීන් අන්තවාද කෙරේ දැක්වූ ප්‍රතිචාර සාර්ථක වූ බවට සිතිය නොහැක. භාරතීය සංශයවාදීන් අන්තවාද බැහැර කළ ද අන්තවාදී නොවන මතයක් හෝ නිගමනයක් හෝ නිශ්චිත ප්‍රතිවේධයක් හෝ ගෙනහැර දක්වා නොමැත. එබැවින් බුදු සමයේ අන්තවාද බැහැර කරන ආකාරයත්, මේ පිළිබඳ සංශයවාදීන් දැක්වූ ප්‍රතිචාරත් අතර එක සමානත්වයක් සෙවීම නොකළ යුත්තකි. මන්ද, අන්තවාද බැහැර කිරීම අතින් ඇතැම් විටෙක එක්තරා වාදයක එල්බ ගැනීමක් හෝ ප්‍රතිවේදයක් ඉදිරිපත් නොකිරීම සංශයවාදීන්ගේ මූලික ලක්ෂණයක් වන අතර සියලු අන්තවාද බැහැර කිරීම හා නිර්වාණය නමැති ප්‍රතිවේධය බුදු සමය තුළින් ඉදිරිපත් වීම නිසා ය.

අන්තවාද බැහැර කිරීම අතින් බුදු සමය සමකාලීන භාරතීය සමාජයේ පැවති දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි සියල්ල ම ප්‍රතික්ෂේප කරයි.[42] අන්තවාද බැහැර කිරීම අතින් බුදු සමය සැලකිල්ලට ගන්නා ප්‍රධාන කරුණ වන්නේ නිර්වාණය යි. ඒ අනුව නිර්වේදය පිණිස, විරාගය පිණිස, විමුක්තිය පිණිස, ප්‍රඥාව පිණිස, සම්බුද්ධත්වය පිණිස හේතු නොවන මතවාද කෙරේ බුදු සමය සිය අප්‍රසාදය පළ කරයි.[43] මේ පිළිබඳ ව තවදුරටත් කරුණු විස්තර කරන බුදුන්වහන්සේ කච්චාන තෙරුන්ට පෙන්වා දෙනුයේ ලෝකයේ බහුල වශයෙන් ඇති බව (අත්ථි තඤ්ච) හා නැති බව (නත්ථි තඤ්ච) යන දෙකරුණු ආශ්‍රය කොට ගෙන පවතින බව යි.[44] ලෝකයෙහි ඇතිවීම තත් වූ පරිදි මනා ප්‍රඥාවෙන් දකින්නා හට ලෝකය පිළිබඳ යම් නැති බවක් වේ ද, එය නොවන බවත් (ලෝක සමුදයඤ්ච ඛො කච්චාන යථාභූතය සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථියා සා නහොති), ලෝකයෙහි නැතිවීම තත් වූ පරිදි මනා වූ ප්‍රඥාවෙන් දකින්නා හට ලෝකය පිළිබඳ යම් ඇති බවක් වේද, එය නොවන බවත් (ලෝක නිරෝධං ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථියා සා නහොති), ලෝකයේ බහුල වශයෙන් ම උපාය, උපාදාන, අභිනිවේසයන් (උපායුපාදානාභිති වෙසවීනිබද්ධො) බැඳී පවතින බවත්, එය අන්තවාදවලට මූල හේතුව බවත් පෙන්වා දෙයි.[45] එබැවින්, යමෙක් එම අන්තවාද සඳහා හේතුවන උපාය, උපාදාන හා අභිනිවේසයන් ග්‍රහණය නොකෙරේ ද, ''මෙය මාගේ ආත්මය යැයි දැඩි ව නොගනී ද, දුකත්, දුකෙහි නිරෝධයත් පිළිබඳ සැකයටත්, විමතියටත් නොපැමිණි ඔහුට අනුන්ගෙන් නොඋපන් ඥානය ඇත.[46] මේ අනුව සියල්ල ඇත යනු එක් අන්තයකි (සබ්බ අත්ථීති ඛො කච්චායන අයං ඒකො අන්තො), සියල්ල නැත යනු දෙවන අන්තය යි (සබ්බං නත්ථීති අයං දුතියෝ අන්තො) යනුවෙන් දක්වන බුදුරදුන් පෙන්වා දෙන්නේ තමන් වහන්සේ මෙම අන්ත දෙකට නොපැමිණ මධ්‍යයෙන් ධර්මය දේශනා කරන බව යි. (එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දේසෙති)[47]

මේ සම්බන්ධ තවත් වැදගත් කරුණක් දීඝනඛ සූත්‍රයේ දී පෙන්වා දී ඇත. කිසියම් ආකාරයක අන්තවාද පිළිබඳ බුදුරදුන් සිය ආකල්පය විචාරාත්මක ව ගෙනහැර දක්වන මෙහි දී හමුවන දීඝනඛ නමැත්තා පිළිබඳ ව ද කරුණු අනාවරණය කර ගැනීම අතිශය වැදගත්



බව පෙනේ.[48] දීඝනඛ සූත්‍රයේ දී දීඝනඛ පරිබ්‍රාජකයා දිට්ඨි පිළිබඳ කරුණු හෙවත් මතවාද තුනක් කෙරේ දක්වන අදහසත් ඊට බුදුන්වහන්සේ දක්වන ආකල්පයත් කෙරේ අවධානය යොමු කිරීම ද වැදගත් ය. මෙහි දෘෂ්ටි පිළිබඳ ගෙනහැර දක්වන මතවාද තුන නම්,

**1. සබ්බං මෙ ඛමති** - මම සෑම දෘෂ්ටියකට ම එකඟ වෙමි.
**2. සබ්බං මෙ න ඛමති** - මම කිසිදු දෘෂ්ටියකට එකඟ නොවෙමි.
**3. එකච්චං මෙ ඛමති, ඒකච්චං මෙ න ඛමති** - සමහර දෘෂ්ටින්ට මම කැමති වන අතර, තවත් සමහර දෘෂ්ටීන්ට කැමති නොවෙමි.[49] යනාදියයි.

මෙහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ පළමු දෘෂ්ටියත් තෙවැනි දෘෂ්ටියත් හැර තමා දෙවන මතය දරන බව දීඝනඛ බුදුරදුන්ට පවසයි.[50] ඊට බුදුරදුන් දුන් පිළිතුර වූයේ දෙවැනි මතය ආධානග්‍රාහී ව දැරීම හා එහි එල්බ සිටීම අන් මතයක් දැරීමටත් වඩා භයානක බව යි.[51]

මේ අනුව දෙවන මතයෙහි අර්ථ නිරූපණය දෙයාකාර වන බව පෙනේ. එනම්,

1. තමන් කිසිදු මතයකට එකඟ නොවෙමියි යන්න ආධානග්‍රාහී ව දැරීම
   (තඤ්ංච ව දිට්ඨිං නප්පජහන්ති, අඤ්ඤං ච දිට්ඨිං උපාදයන්ති)[52]
2. තමන් කිසිදු මතයකට එකඟ නොවෙමියි යන්න ආධානග්‍රාහී ව නොදැරීම
   (තඤ්චේ ව දිට්ඨිං පජහන්ති. අඤ්ඤංච දිට්ඨිං න උපාදියන්ති)[53]

යනාදිය යි.

යමෙක් මෙහි පළමුවැනි ආකාරය (දෘෂ්ටියක් ලෙස) දරන්නේ නම් හෙතෙම දෙයාකාරයකින් සිය වෛරය නගයි. එනම්,

1. තමන් ගත් මෙම මතය ආධානග්‍රාහීව ගැනීම.
2. මෙම මතය වෙනත් ස්වරූපයකට වෙනස් වීමට ඉඩ නොදීම

යනාදිය යි.

මෙහි පළමු (2.1 වැනි) මතය දැරීමෙහි ප්‍රතිඵලය වන්නේ කලහවලට මුහුණ දීමට සිදුවීම යි.[54] ඉන් අනතුරුව විවාදවලටත් (විවාදො), විපත්වලටත් (විඝතො), වෙහෙසටත් (විහෙසො) පත්වීමට

සිදු වේ.[55] එහෙත් මෙහි දෙවැනි (2.2) මතය දැරීමෙන් දෘෂ්ටිය රැක ගැනීමට වෛරය වැඩීම කෙරේ යොමු නොවේ. එයට හේතුව එය මධ්‍යස්ථ මතයක් වීම යි. මෙහි ඉහතින් ම සාකච්ඡා කළ මත තුනෙන් දෙවැනි අදහස දැරුව ද දීඝනඛ දෙවැනි මතයේ ප්‍රකාර දෙකෙන් පළමු වැනි මතය දරන්නෙකි. මේ අනුව ජයතිලක මහතා පෙන්වා දෙන්නේ දීඝනඛ (තමන් කිසිදු මතයක් නොදරන බව ආධානග්‍රාහී ව පිළිගන්නා නිසා) බුදුන්වහන්සේ අභිමුව ස්වයං ප්‍රතිවිරෝධයකට පත් වන බව යි.[56] එහෙත් භාරතීය සමාජය තුළ උපාදානය ප්‍රතික්ෂේප කළ සංශයවාදීන් ද සිටි නිසා බුදුන් වහන්සේ ඔවුන් පිළිබඳ දැක්වූ අදහස යහපත් වූවක් බව මෙමගින් පෙනේ. කෙසේ නමුත් බුදුරදුන් මෙහි දී පෙන්වා දීමට උත්සාහ ගෙන ඇත්තේ ආධානග්‍රාහීත්වයෙන් තොරව සියලු දෘෂ්ටි ප්‍රහාණය කිරීමේ ඇති වැදගත්කම යි.

## 3. සදාචාරාත්මක නැඹුරුව

සංශයවාදයේ සදාචාරාත්මක නැඹුරුව පිළිබඳ අදහස සහමුලින් ම ප්‍රතික්ෂේප කරන බ්‍රිතාන්‍ය ජාතික ජෝර්ජ් ස්ටුවට් මිල්ගේ මූලික ආකල්පය වූයේ සමාජය වෙනස් වීමට චින්තනය බලපාන බව යි. සංශයවාදී චින්තනය සමාජ ප්‍රගතිය විෂයෙහි ලා බරපතළ අභියෝගයක් වන බවත් සමාජයක් දූෂිත බවට පත්වන්නේ සංශයවාදීන්ට ගොදුරු වීමෙන් බවත්[57]සංශයවාදයට විරුද්ධවන්නන් යම් ආකාරයක සංශයවාදී යුගයක් ඇතිවුවහොත් අවුල් මතුවී සමාජ පිරිහීම වැළැක්විය නොහැකි බව දක්වයි.[58] එහෙත් මෙම නිර්දය විවේචන කිසිම කලෙක පැවති සංශයවාදී දර්ශනයට අනුයෝජනය කිරීම සාර්ථක නොවන්නේ සංශයවාදය නිසා පිරිහුණු හෝ දූෂිත වූ සමාජයක් පිළිබඳ තොරතුරු හමු නොවන බැවිනි.

ආධානග්‍රාහී මිථ්‍යා මත, දුර්වල ඥාන විභාගාත්මක ක්‍රම ඉවත් කොට නිදහස් හා ශක්තිමත් දර්ශනයක් ගොඩනඟා ගැනීමට සංශයවාදය උපයෝගී කරගත් අයුරු බටහිර සෑම දාර්ශනික යුගයකින් ම දිස්වන්නකි. චතුර ලෙස බිණීමේ හා ලිවීමේ ශක්‍යතාව සංශයාත්මක තාර්කික ක්‍රමවේදයක් සමග මුසු කළ විතණ්ඩවාදීහු සිය නිර්දය විවේචන තුළින් සාම්ප්‍රදායික මිථ්‍යා විශ්වාස බැහැර කිරීමට ප්‍රයත්න දැරූහ. සංශයවාදයේ දාර්ශනික අගය තීව්‍ර කළ පයිරෝ, දාර්ශනික මුනිවරයෙක් ලෙස සැලකීමට මූලික හේතුව විය යුත්තේ



සංශයාත්මක අදහස් අනුව තනා ගත් විශේෂිත චරණ පද්ධතියක් හෙතෙම අනුගමනය කළ නිසාවෙනි.

ඉහතින් දැක් වූ සංශයවාදීන් පිළිබඳ නිර්දය විවේචන භාරතීය අමරාවික්ඛේපවාදීන්ට කිසිසේත් අදාළ නොවන බව පෙනේ. විශේෂයෙන් ම සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක කරුණු නිසා නිශ්චිත මතයක් දැරීමේ දුෂ්කරතාව පෙන්වා දුන් මොවුන් පිළිගත හැකි කරුණු තුළින් ඥානය ගොඩනඟා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කළ බව පෙනේ. බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් අමරාවික්ඛේපවාදී ගුරුකුල හතරෙන් අඥානභාවය නිසා සංශය භාවිත කළ පිරිස හැර සෙසු පිරිස කෙරේ මෙහිදී වැඩි අවධානයක් යොමු කළ හැක. චරණ පද්ධතිය අනුව මුසාවාදයට බියෙන් මුසාවාදය ප්‍රතික්ෂේප කළ පිරිසගේ අදහස වූයේ අධිභෞතිකවාද හා සදාචාරාත්මක ප්‍රස්තුත ඇතුළු සත්‍යෙක්ෂණය කළ නොහැකි දෑ කෙරේ පැමිණි නිශ්චිත නිගමනය බොරුවක් වන්නේ නම් එය දුකට හේතුවක් වන බව යි. මේ අනුව දැඩි කැමැත්ත (ඡන්දො) හෝ දැඩි ආශාව (රාගො) හෝ ද්වේශය (දොසො) හෝ කෝපය (පටිසො) හෝ මුල් කොට ගෙන යම්කිසි නිගමනයකට පැමිණ ඒ පිළිබඳ ප්‍රකාශයක් කරන්නේ නම් ඇතැම් විට මුසාවක් විය හැක.[59] අවසානයේ එම මුසාවෙන් ඇති වන ප්‍රතිඵලය තමන්ට විපතක්, බාධාවක් විය හැකි (යං මමස්ස මුසා සො මමස්ස විඝාතො යො මමස්ස විඝාතො, සො මමස්ස අන්තරයෝඩති)[60] බව ඔවුන්ගේ මතය යි. මොවුන්ගේ අදහස බුදු සමයේ සමස්ත ඉගැන්වීම් සමග කිසිසේත් නොගැළපිය හැක්කක් නොවේ. මුසාවාදය ප්‍රතික්ෂේප කිරීම[61] බුදුන්වහන්සේ ද නොයෙක් වර අවධාරණය කර ඇති අතර එය පංචශීලයට ද අන්තර්ගත වීමෙන් මේ බව වඩාත් පැහැදිලි වේ.

උපාදානයට බිය වී එය ප්‍රතික්ෂේප කළ පිරිස ද ඉහත කී පරිදි ඡන්දය, රාගය, ද්වේශය හා පටිඝ මුල් කොට ගෙන සත්‍යෙක්ෂණය කළ නොහැකි දෑ පිළිබඳ නිශ්චිත නිගමනයක් දීමෙන් වැළකෙති. ඔවුන් අදහස් කළ පරිදි යමක් දැඩි ලෙස ගත් විට එයින් සිදු වන හානිකර තත්ත්වය කොතෙක් දුරට විහිදී යන්නේ දැයි යන්න සොයා බැලීමට පැහැදිලි තොරතුරක් හමු නොවෙතත් බුදු සමය පෙන්වා දෙන ආකාරයට මෙලොව වශයෙන් පමණක් නොව සාංසාරික

ජීවිතයටත් එය බරපතළ ලෙස බලපායි. එලෙසින් ම විවාදයට බිය වී එය ප්‍රතික්ෂේප කළ පිරිස ද සිය සංශයවාදී ස්ථාවරයට සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක වටිනාකමක් ලබා දී ඇත.

පුද්ගල චරණය හා සම්බන්ධ කොට ගෙන ඉහතින් සාකච්ඡා කළ පරිදි අමරාවික්ඛෙපවාදීන් දක්වා ඇති අදහස් හා බෞද්ධ අදහස් තුලනාත්මකව කිසියම් සැසඳීමක් කෙරේ ද අවධානය යොමු කළ හැක. ඒ අනුව මුසාවාදයට බිය වීම හා එය පිළිකුල් කිරීම පුද්ගලබද්ධ කරුණකි. එය පෞද්ගලික ජීවිතය නැතහොත් පුද්ගල පෞරුෂයේ වැදගත් සාධකයකි. එමෙන් ම ඉහතින් සාකච්ඡා කළ පරිදි උපාදානයට බිය වීම හා එය පිළිකුල් කිරීම ආධ්‍යාත්මික ජීවිතය හා සම්බන්ධ කරුණක් ලෙස ගැනීම වැදගත් ය. සාංසාරික වශයෙන් පුද්ගල පැවැත්ම කෙරේ තීරණාත්මක ලෙස බලපාන සාධකයක් ලෙස මෙය සාකච්ඡා කළ හැක. විවාදයට බිය වීම හා එය පිළිකුල් කිරීම විශේෂයෙන් ම සමාජ ජීවිතය හා සම්බන්ධ කරුණකි. යහපත්, සාමකාමී සමාජයක් සඳහා විවාදය එතරම් හිතකර සාධකයක් නොවන බව අපගේ සාකච්ඡාවෙන් මතු වූ ප්‍රධාන කරුණකි. සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක වශයෙන් ඉහත කී සාධක වටිනා නමුත් ආඥානාභාවය මුල් කොට කිසියම් ප්‍රස්තුතයක් පිළිබඳ නම්‍යශීලී අදහසක් දැරීම යමෙකුගේ දාර්ශනික ජීවිතයට වඩා වටිනා බව පෙනේ. එයට හේතුව වන්නේ, යමක් කෙරේ සාතිශය මධ්‍යස්ථ මත දැරීම නිශ්චිත ව නොදන්නා ඕනෑ ම දෙයක් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මහෝපකාරී වන බැවිනි. ග්‍රීක දර්ශනයේ ප්‍රායෝගික දාර්ශනිකයා ලෙස සැලකෙන සොක්‍රටීස් පවා සිය අඥානභාවය නිර්භයව ප්‍රකාශ කර ඇත.[62] මේ කරුණ ධම්මපදයේ දී පවා විග්‍රහ වී ඇති බව පෙනේ.

''යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං - පණ්ඩිතෝ වාපි තේ නයෝ
බාලෝ ච පණ්ඩිත මානි - සවේ බාලෝති වුච්චති''[63]

එනම්, යම් අනුවණයෙකුට තමාගේ අනුවණකම මනාව වැටහේ නම්, එම කාරණයෙන් ඔහු පණ්ඩිතයෙකු වේ. තමා අනුවණයෙක්ව සිට පණ්ඩිතයෙකුයි සිතන්නා ඒකාන්තයෙන් ම මෝඩයෙකුයි කියනු ලැබේ යන්න යි.



## 4. මනෝභාව පිළිබඳ මධ්‍යස්ථතාව

භාරතීය සංශයවාදීන් හා බුදු සමය අතර පෙනෙන තවත් සමානතාවක් ලෙස මනෝභාව පිළිබඳ මධ්‍යස්ථාව යන කරුණ කෙරේ අවධානය යොමු කළ හැකි බව පෙනේ. මෙම චතුර්විධ අමරාවික්ඛෙපවාදීන් ඕනෑ ම පුද්ගලයෙකුට ඇති විය හැකි අසතුටුදායක මානසික කරුණු හෙවත් මනෝභාව කිහිපයක් තුළින් අන්තයකට පැමිණීමෙන් අත් විය හැකි භයානක ප්‍රතිඵල කෙරේ සැලකිලිමත් විය. ඡන්දය, රාගය, ද්වේශය හා කෝපය හෙවත් පටිඝ යන අසතුටුදායක මනෝභාව හා ඒවා තුළින් අන්තවාදී වුවහොත් අත්විඳීමට සිදුවන අසතුටුදායක තත්ත්වවල ආදිතම අවස්ථාව ද මානසික වශයෙන් බලපාන අතර, පසුව එය පුද්ගලයා හා බැඳුණු විවිධ අංශයන් කෙරේ අයහපත් ලෙස බලපාන බව ඔවුන්ගේ අවධානය යොමු වූවා විය හැක. එබැවින් ඕනෑ ම අවස්ථාවක මධ්‍යස්ථ මානසික තත්ත්වයක් තුළ හිඳීම පුද්ගලයා හා බැඳුණු විවිධ අංශයන් කෙරේ යහපත් ආකාරයෙන් බලපාන බව අමරාවික්ඛෙපවාදීන්ගේ ඉගැන්වීම් අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

මනෝභාව තුළින් අන්තවාදී වුවහොත් ඇති වන දුෂ්කරතා මානසික වශයෙන් පමණක් නොව සදාචාරාත්මක වශයෙන් පුද්ගලයාගේ විවිධ අංශවලට ඇති කළ හැකි බලපෑම් සැලකිල්ලට ගෙන බැලූ විට එයින් වැළකී සාතිශය මධ්‍යස්ථ මනෝභාව තුළ රැදීමට අමරාවික්ඛෙවාදීන් ගත් ප්‍රයත්නය ප්‍රශස්ත ය. බුදුන්වහන්සේ සත්‍ය යටපත් වන්නා වූ චිත්තාවේග පිළිබඳ දක්වූ ආකල්පයට ද මෙම අදහස තුලනය වන බව පෙනේ. ''අන්‍ය ආගම් හා ධර්ම සම්බන්ධව හෝ ඔවුන් කෙරේ තණ්හාවක්, දුෂ්ට චේතනාවක් ඇති කර නොගන්න. ඔබ කෝපයට පත් වී සිටින විට සිත නොසංසුන් වුවහොත් අන්‍යයන්ගේ ප්‍රකාශන යහපත්ද, නැද්ද යන්න දැන ගැනීමට ඔබට හැකියවක් ඇති වේද?''[64] යන ප්‍රකාශය මෙහිදී සලකා බැලිය හැක.

## සමාලෝචනය

නිශ්චිත වූ සුවිශේෂ පරමාර්ථයකින් විමර්ශනාත්මක අභිරුචිය පෙරදැඩි කොට ගත් සංශයවාදී ලක්ෂණ පිළිබිඹු කරන්නා වූ ගණයෙහි ලා බුදු දහම ද, සැලකීම නිරවද්‍ය බව පෙනේ. බුදුන්වහන්සේගේ බුද්ධත්වය අතිශය ප්‍රබල විමර්ශනාත්මක අභිරුචියක ප්‍රතිඵලයකි.

ශුද්ධ සංශයවාදී චින්තනයෙහි එන සංශයාත්මක පෙළඹීමක් මත විමර්ශනාත්මක අභිරුචිය අවධාරණය කිරීම, අන්තවාද බැහැර කිරීම, වාදශීලී බව ප්‍රතික්ෂේප කිරීම, ව්‍යාජ ප්‍රෝඩාකාර ගූඪ මතවාද බැහැර කිරීම, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ දුබලතා පෙන්වා දීම, සර්ව සම්පූර්ණ ඥානය ප්‍රතික්ෂේප කිරීම හා ඥානයේ සීමාවලින් ඔබ්බට යාමේ අනවශ්‍ය බව පෙන්වා දීම යනාදි කරුණු බුදු සමය තුළින් ද ප්‍රකට වීම මෙහිදී වැදගත් වේ. අනෙක් අතට, භාරතීය අමරාවික්ඛේපවාදීන් පිළිබඳ බෞද්ධ ආකල්පය සලකා බලන විට බොහෝ අංශවලින් හිතකර වූවක් බව ද පෙනේ. සන්දක සූත්‍රයේදී අමරාවික්ඛේපවාදීන්ගේ ධර්මය අසතුටුදායක සතරාකාර ආගම්වලින් එකක් ලෙස පෙන්වාදී තිබුණ ද මුළුමනින් ම අසත්‍ය වන ආගමක් ලෙස දක්වා නොමැති බව පෙනේ. එසේ ම මොවුන් පෙන්වා දෙන සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක පසුබිම බුදු සමය සමග ද මැනවින් තුල්‍ය වේ.

සංශයවාදී දර්ශනය සමග තුල්‍ය වන ලක්ෂණ දරුව ද, බුදු සමය කිසිසේත් ම සංශයවාදයක් ලෙස ගැනීම උචිත නොවේ. සංශය, සංශය උදෙසා ම භාවිත කළ පිරිසත්, සංශය නිශ්චිත වූ සුවිශේෂී පරමාර්ථයක් උදෙසා භාවිතා කළ පිරිසත් සමස්තයක් ලෙස ගෙන එයින් බුදු දහම වෙන ම පිහිටුවා සාකච්ඡා කළ හැකි කරුණක් ද මෙහිදී පෙනී යයි. එනම්, බුදු දහම හැර සංශයවාදී චින්තාවන් පිළිබිඹු කරන අනෙකුත් සියල්ලක් ම බුද්ධිවාදී ස්ථාවරයක් වෙත පිය නගන බුද්ධිවාදී චින්තාවන් ලෙස හඳුනා ගැනීමට හැකි වන විට බුදු දහම අනුභූතිවාදී ස්ථාවරයක් මත පදනම් වෙමින් විමර්ශනාත්මක අභිරුචිය මෙහෙයවීම යි. බුද්ධිවාදි ඥාන මාර්ග බැහැර කොට අනුභූතිවාදී ප්‍රවේශයකින් ඥානය අවධාරණය කිරීම පමණක් නොව, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් නොනැවතී අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය අවධාරණය කිරීම හා සියලු දුක් නැති කොට නිවන් අවබෝධ කර ගැනීමට මග පෙන්වා දීම අතින් ද බුදු දහම සංශයවාදී දර්ශනයෙන් වෙනස් වන බව පෙනේ. අනෙක් අතට සංශය මෙහෙයවා ප්‍රතිවේධයක් අවධාරණය කළ පිරිස් අතරින් ද බුදු දහම සුවිශේෂී වන්නේ, ප්‍රායෝගිකව සියලු දෙනාට අවබෝධ කළ හැකි නිර්වාණය නම් වූ ආධ්‍යාත්මික මාර්ගයක් ඉදිරිපත් කළ බැවිනි.



**ආන්තික සටහන්:**

1. කලන්සූරිය ඒ. ඩී.පී. ග්‍රීක දර්ශනය, පි. 99.
2. වික්‍රමසිංහ අනුර, එන්, ප්‍රාග් බෞද්ධ භාරතීය ආගම් දර්ශන සම්ප්‍රදා විචාරාත්මක හඳුන්වාදීමක්, 66.
3. පන්සියපනස් ජාතකපොත්වහන්සේ 1, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003, පි. 57 - 63.
4. එම, පි. 292 - 297.
5. එම, පි. 64 - 66.
6. කලුපහන ඩී.ජේ, බෞද්ධ දර්ශන ඉතිහාසය, පි. 24.
7. ම. නි. 1, මහා සච්චක සූත්‍රය, පි. 582.
   ''ආජානාමි බො පනාහං පිතුක්කස්ස කම්මන්තෙ සීතාය ජම්බුච්ඡායාය නිසින්තො විවිච්චේව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිත්තකං සවිචාරං විවේකජං පිත සුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතා''
8. ගල්මංගොඩ සුමනපාල, ආදී බෞද්ධ දර්ශනය, මූලධර්ම විග්‍රහයක්, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය, 2007, පි. 196.
9. ඛු. නි. සුත්ත නිපාතය, පබ්බජ්ජා සූත්‍රය, පි. 122, ගාථාව 408.
   ''සම්බාධොයං ඝරාවාසො රජස්සායතනං ඉති - අබ්භො කාසොව පබ්බජ්ජා ඉති දිස්වාන පබ්බජි''
10. එම, පි. 124, ගාථාව 426.
    ''කාමෙස්වාදීනවං දිස්වා- නෙක්ඛම්මං දට්ටුඛේමතො
    පධානාය ගමිස්සාමි - එත්ත මෙරජ්ජති මනොති''
11. ම. නි. 1, අරියපරියේසන සූත්‍රය, පි. 400.
12. එම, පි. 400.
13. එම, පි. 398.
14. එම, පි. 400 - 406.
15. ම. නි. 1, මහා සච්චක සූත්‍රය, පි. 582.
    ''න බො පනාහං ඉමාය කටුකාය දුක්කංකාරිකාය අධිගච්ඡාමි උත්තරී මනුස්සධමමා අලමරියඥාණදස්සන විසේසං. සියා නුබො අඤ්ඤො මග්ගො බො බොධායාඬති.''
16. සං. නි. 5, II, ධම්මචකක පවත්තන සූත්‍රය, පි. 272.
17. යසස්සී හිමි පනහඩුවේ, නිදහස් චින්තනය හා වීමංසනයඃ ආගමික දාර්ශනික මූලධර්ම විග්‍රහයක්, මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය, පුවක්පිටිය, 2009, පි. 23.
    මාන දී ස, මාන දී මාන දී ස, වී දී මං දී ස
18. බුද්ධදත්ත හිමි පොල්ලත්තේ, පාලි - සිංහල අකාරාදිය, පි. 471.
    ''මාන දී සාඃ මා - හට ද්විත්ව වේ. ප්‍රථම මා - හට වී - ආදේශ වේ. ඉතිරි මාන - කොටසට මං - ආදේශ වේ''
19. යසස්සී හිමි පනහඩුවේ, නිදහස් චින්තනය හා වීමංසනය ආගමික හා දාර්ශනික මූලධර්ම විග්‍රහයක්, පි. 24.
20. දීඝ නිකාය ටීකා, මහා සතිපට්ඨාන සූත්ත, සෝමාවතී හේවාවිතාරණ, මරදාන, 1967, පි. 512.
    ''යථාවතො ආදීනවානිසංසානං පටිසංඛානං වීමංසා ඉධ පටිසංඛානං''

21. දීඝ නිකාය ටීකා, බ්‍රහ්මජාල සුත්ත, එම, පි. 103.
''අනුවිචරිතන්ති වීමංසාය අනුපවත්තිතං, වීමංසානුගතේන වා විචාරේන අනුවප්පිතං''
22. මහා නිද්දේසට්ඨ කථා, සුදට්ඨක සුත්ත නිද්දේස වණ්ණනා, සයිමන් හේවා විතාරණ, කොළඹ, 1921, පි. 156.
''වීමංසාතිඃ චතුසච්ච ධම්ම විචිනනා පඤ්ඤා ච, වීමංසා ධම්ම විචිනනා ති වුත්තා''
23. ඛු. නි. පේටකෝපදේසය, පංච භූමි, හාර විභංගය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ පුනර් මුද්‍රණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1989, පි. 116.
24. අං. නි. 5, සීහසේනාපති සූත්‍රය, එම, පි. 60.
25. ම. නි. 2, උපාලි සූත්‍රය, එම, පි. 70.
26. දීඝ නිකායට්ඨ කථා, බ්‍රහ්මජාල සුත්ත වණ්ණනා, පඨම වග්ගො, සයිමන් හේවාවිතාරණ, කොළඹ, 1918, පි. 76.
27. Manorathapūraṇi - III, Editor: kopp Hermann, The pali Text society, Oxford,1998, pg. 372.
28. ඛු. නි. මහා නිද්දේස පාලි, එම, පි. 386.
''මුනි සස්සත දිට්ඨි නිස්සිතානි ඤත්වා, උච්ඡේද දිට්ඨි නිස්පිතානි ඤත්වා, සස්සුතච්ඡේද නිස්සිතානි ඤත්වා, තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා, විභුතංකත්වා සො විමංසති, පණ්ඩිතො පඤ්ඤාවා බුද්ධිමා විභාවි මෙධාවතී''
29. ම. නි. 1, විමංසක සූත්‍රය, එම, පි. 744.
30. සං. නි. 5, ඉද්ධිපාද සංයුත්තය, පාසාද කම්පන වග්ගය, මහප්ඵල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ පුනර් මුද්‍රණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1982, පි. 22.
''ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති, න ච අතිපග්ගහිතා භවිස්සති, න ච අජ්ඣත්තං සංඛිත්තා භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති''
31. දී. නි. 2, මහා පරිනිබ්බාණ සුත්ත, පි. 192.
32. දී. නි. 2, මහා පරිනිබ්බාණ සුත්ත, පි. 194.
33. දී. නි. 2, මහා පරිනිබ්බාණ සුත්ත, එම, පි. 194.
34. දී. නි. 2, මහා පරිනිබ්බාණ සුත්ත, එම, පි. 196.
35. දී. නි. 2, මහා පරිනිබ්බාණ සුත්ත, එම, පි. 196.
36 මහායාන දර්ශනයේ සුප්‍රකට ආචාර්යවරයෙකු වූ ආර්යදේවපාදයන් ඥානසාර සමුච්චය නම් කෘතියේ දී බුදු සමයේ විචාරශීලී පදනම දක්වා ඇත්තේ මෙසේ ය.
තාපාත්ඡේදාත් ච නිකෂාත් - සුවර්ණමිව පණ්ඩුතෛඃ
පරීක්ෂ්‍ය භික්ෂවෝ ග්‍රාහ්‍යං - මද්වචො නතු ගෞරවාත්
මහණෙනි, නුවණැති රන් කරුවා විසින් රන් කැබැල්ලක් ගෙන එය තවා, කපා, උරගා, ඔප මට්ටම් කර රන් බව හඳුනා ගන්නා ආකාරයට ඔබ ද මාගේ වචනය පිරික්සීමෙන් මිස හුදු ගෞරවයෙන් පමණක් නොපිළිගත යුතු ය.



37. ධම්මපදට්ට කථා 1, සිංහල පරිවර්තනය, එම, පි. 58.
සැපවත්, සුවපත් ගෘහ ජීවිත ගත කළ කෝලිත - උපතිස්ස දෙදෙනා විනෝදකාමී ජීවිත කළහ.ඒ බව ගිරග්ග සමජ්ජ බඳු උත්සවවලට සහභාගී වීමෙන් පෙනේ. එහෙත් ජීවිතයේ හරය නොහොත් නිෂ්ඨාව තමන් ලද විනෝදාස්වල නැතැයි සිතු මොව්හු මෝක්ෂය සොයා යාමේ ප්‍රතිඵලයක් ලෙස මහත් වූ පිරිවරක් සමග වාසය කළ සංජය පිරිවැජියාගේ අනුගාමිකයෝ වූහ.
38. ම. ව. ප. 1, එම, පි. 86.
''විජ්සනන්නාති බො තෙ ආවුසො, ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො කංසිත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො?''
39. එම, පි. 86.
''යෙ ධම්මා හේතුප්පභවා තේසං හේතුං තථාගතො ආහ තෙසඤ්ච යො නිරෝධා එවං වාදි මහා සමණො''
40. දි. නි. 1, කේවඩ්ඩ සූත්‍රය, එම, පි. 526.
41. එම, පි. 526 - 538.
42. දි. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය. එම, පි. 78.
43. ම. නි. 2, අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, පි. 260.
44. සං. නි. 2, කච්චානගොත්ත සූත්‍රය, පි. 28.
45. එම, පි. 28.
46. එම, පි. 28.
47. එම, පි. 28.
48 දීඝනඛ මෙන් ම ඔහුගේ ඉගැන්වීම නොහොත් වාදය පිළිබඳ උගතුන් අතර ඒකමතිකත්වයක් නොමැති බව පෙනේ. දීඝනඛ පිළිබඳ දැක්වෙන පෙළ හා අටුවා විවරණවලට අනුව ඔහු ඉතා පැහැදිලි ව ම නාස්තිකවාදියෙකි. නමුත් මහාචාර්ය මලලසේකර මහතා දක්වන ආකාරයට ඔහු බ්‍රාහ්මණයෙක්49 නොව පරිබ්‍රාජකයෙකි. (දීඝනඛො පරිබ්බාජකො)50 මහාචාර්ය ජයතිලක මහතා පෙන්වා දෙන පරිදි ඕල්ඩන්බර්ග් මහතාගේ අදහස නම් දීඝනඛ වනාහී භාරතීය තාර්කික සංශයවාදයක ආරම්භක ලක්ෂයකි.51 දීඝනඛ සැරියුත් හිමිගේ ඥාතියෙකු වීමත්, සැරියුත් හිමි ගිහි කල සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ ගෝලයෙක් ව සිටීමත්52 සලකා බලන විට හෙතෙම සංශයවාදියෙක් නොවන්නේ මන්ද? යන සැකය මතු වේ. මෙකී කරුණු අනුව දීඝනඛ පිළිබඳ කේ. එන්. ජයතිලක මහතා මොහු විවාදයට එළඹි එක ම සංශයවාදී ගුරුකුලය වූ සඤ්ජයගේ ගුරුකුලයට අයත් විණැයි සිතිය හැකි බව 53 දක්වයි.
Malasekara G.P., Doctonary of Pali - Proper names vol - I Manshiram manoharlal publishers, pvt. Ltd, New Delhi, 1983, Pg. 1082. "Perhaps he is the heretic Brahmin…."/ම. නි. 2, දීඝනඛ සූත්‍රය. එම, පි. 280./ජයතිලක කේ. එන්. මුල් බුදු සමයේ ඥාන විභාගය, එම, පි. 318./පපඤ්චසූදනී III, සිංහල පරිවර්තනය, එම, පි. 141./ජයතිලක කේ. එන්. මුල් බුදු සමයේ ඥාන විභාගය, එම, පි. 324.
54. ම. නි. 2, දීඝනඛ සූත්‍රය. එම, පි. 280.
55. එම, පි. 280.
''අහං හි භො ගොතම ඒවංවාදි, ඒවං දිට්ඨි සබ්බං මෙ න ඛාමතීති.''

56. එම. පි. 280.
"අතො බො තෙ අග්ගිවෙස්සන බහුහි බහුතරා ලෝකස්මිංයෙ ඒවමාහංසුත තම්පස්ස තාදිසමෙව, තම්පස්ස තාදිසමෙවාති තෙ. තඤ්චේව දිට්ඨිං නප්පජහන්ති, අඤ්ඤඤ්ච දිට්ඨිං උපාදියන්ති"
57. එම, පි. 280.
58. එම, පි. 280.
59. එම, පි. 282.
"ද්විහි මේ අස්ස විග්ගහො"
60. එම, පි. 282.
61. ජයතිලක කේ. එන්. මුල් බුදු සමයේ ඥාන විභාගය, එම, පි. 320
62. විමලධම්ම හිමි කන්දෙගොඩ, ආචාර ධර්ම. කර්තෘ ප්‍රකාශනයකි, 2010, පි. 82.
63. එම, පි. 82.
64. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, එම, පි. 44.
65. එම, පි. 44.
66. දී. නි. 3, චක්වත්තිසීහනාද සූත්‍රය, එම, පි. 106.
"මුසා න භාසිතබ්බා"
67 "මා දන්නා එක ම දෙය කිසිවක් නොදන්නා බව යි" යන්න සොක්‍රටීස් කළ සුප්‍රකට ප්‍රකාශයකි. එලෙස ම සොක්‍රටීස් දැනීම සම්බන්ධ කොට ගෙන පුද්ගලයන් සතර දෙනෙක් පෙන්වාදී ඇත. එනම්,
1. යමෙක් දන්නේ ද, දන්නා බව නොදන්නේ ද ඔහු නින්දේ ය. අවදි කරන්න.
2. යමෙක් නොදන්නේ ද, නොදන්නා බව නොදන්නේ ද, ඔහු මෝඩයෙකි. දුරු කරන්න.
3. යමෙක් නොදන්නේ ද, නොදන්නා බව දන්නේ ද, ඔහු අසරණයෙකි. පිහිට වන්න.
4. යමෙක් දන්නේ ද, දන්නා බව දන්නේ ද ඔහු උගතෙකි. ගරු කරන්න. අමරාවික්ඛේපවාදීන්ගෙන් සිව්වැනි පිරිස වන අඥානභාවය පදනම් කොට ගත් පිරිස මෙම වර්ගීකරණයේ තෙවැනි ගණය සමග බොහෝ විට සමාන වන බව පෙනේ. (මෙම නිගමනයට "ඔහු අසරණයෙකි. පිහිටවන්න" යන්න නොසලකා ඇත.)
68. ඛු. නි. 1, ධම්මපද පාළි, බාල වග්ග, එම, පි. 38.
69. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 4.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:

### ප්‍රාථමික මූලාශ්‍රය:

අං. නි. 1. (1960), 2. (1962), 4. (1970), 5. (1977), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ඛු. නි. 1, ඛුද්දක පාඨ, ධම්මපද පාලි, උදානපාළි, (1960), සුත්ත නිපාතය, (1977) පටිසම්භිදා මග්ග (1979), පේටකෝපදේසය (1989), බුද්ධවංසපාලි (1979), මහානිද්දේස පාලි (1961), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

දී. නි. 1, (1962), 2 (1976), 3 (1976), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

දීඝ නිකාය ටීකා, සෝමාවතී හේවාවිතාරණ, මරදාන, 1967.

පපඤ්චසූධනී 1, හේවාවිතාරණ, 1948.

පන්සියපනස් ජාතක පොත්වහන්සේ 1, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003.

ම. නි. 1 (1973), 2 (1973), 3 (1974), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

මහා නිද්දේසට්ඨ කථා, සයිමන් හේවා විතාරණ, කොළඹ, 1921.

සං. නි. 1 (1960), 2 (1962), 3 (1983), 4 (1981), 5 I (1982), 5 II (1983), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

### ද්විතීයික මූලාශ්‍රය:

#### ශාස්ත්‍රීය ග්‍රන්ථ:

අභයවංශ කපිල, ඉමැනුවෙල් කාන්ට්ගේ ඥාන විභාගයත බෞද්ධ චින්තනය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්, පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, 1997.

අරියවිමල හිමි කොස්වත්තේ, බුද්ධ ධර්මය, සමයවර්ධන, මරදාන, 1996.

ආනන්ද හිමි, උඩුහාවර, ත්‍රිපිටකයෙන් හෙළි වන බුද්ධ චරිතය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2000.

උත්තරානන්ද හිමි ඉඳුරුවේ, දෘෂ්ටි විභාගය, ඉඳුරුව මුද්‍රණ ශිල්පියෝ, ඉඳුරුව, 1972.

කලන්සූරිය ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2007.

කලන්සූරිය ඒ.ඩී.පී, දර්ශනය හැඳින්වීමක්, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2002.

කලන්සූරිය ඒ. ඩී. පී, දාර්ශනික ගැටලු සහ විට්ගන්ස්ටෙන්, සී/ස, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම - පොත් ප්‍රකාශකයෝ, කොළඹ 02, 1986.

කලන්සූරිය ඒ. ඩී. පී, නූතන බටහිර දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2007.

කලන්සූරිය ඒ. ඩී. පී, බටහිර විශ්ලේෂී දර්ශනය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2008.

කලුපහන ඩී.ජේ, භාරතීය දර්ශන ඉතිහාසය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය, 1963.

ගල්මංගොඩ සුමනපාල, ආදී බෞද්ධ දර්ශනය, මූලධර්ම විග්‍රහයක්, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය, 2007.

ජයතිලක කේ. එන්. මුල් බුදු සමයේ ඥාන විභාගය පරිඃහේ.මු. තිලකරත්න, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2003.

ජයතිලක කේ, දර්ශනවාද අසබඩින්, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12, 2005.

ජයසේකර කමනි, ග්‍රීක දර්ශනයට පිවිසුමක්, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2002.

තිලකරත්න අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2001.

තිලකරත්න හේ. මු, මහාචාර්ය කේ. එන් ජයතිලක දර්ශනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2001.

තිලකසිරි ජේ, වෛදික සාහිත්‍යය, කාණ්ඩය 1, ලංකාවේ සී/ස ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ, 1958.

ධම්මානන්ද හිමි තලල්ලේ, සම්බුද්ධ දේශනාව, චරිතය හා තත්කාලීන සමාජය, අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස, 1968.

ධම්මානන්ද හිමි හෝමාගම, බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2004.

ධම්මාලංකාර හිමි ඉත්තෑපාන, බුදු දහමෙහි දාර්ශනික ප්‍රස්තුත (සූත්‍ර පිටකය ඇසුරෙන්), ශ්‍රී දේවි ප්‍රකාශන, දෙහිවල, 2001.

ධර්මසිරි ගුණපාල, දාර්ශනික ප්‍රශ්න, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2007.

නාරද හිමි දියගම, ෂට් ශාස්තෘන් සහ බුදු දහම, කර්තෘ ප්‍රකාශනයකි, 2009.

පඤ්ඤානන්ද හිමි පරවාහැර, ධම්මපාල හිමි වේහැල්ලේ, බටහිර දර්ශන, ප්‍රකාශන ත මංගල ට්‍රේඩර්ස්, කොළඹ 09, 1955.

පීරිස් මර්ලින්, පෙන්නම්පෙරුම ඩී.පී, සොක්‍රටීස් ජීවන චරිතය, සී/ස, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11, 1999.

බර්නට් ජෝන්, ආදී ග්‍රීක දර්ශනය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1964.

බෂාම් ඒ. එල්, අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1995.





මහින්ද හිමි උණුවතුරබුබුලේ, නන්දිසේන ජී.ඩබ්, බුද්ධකාලීන ග්‍රීක දර්ශනය II, ඇස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10, 2009.

යසස්සී හිමි පනහඩුවේ, නිදහස් චින්තනය හා වීමංසනයඃ ආගමික දාර්ශනික මූලධර්ම විග්‍රහයක්, මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය, පුවක්පිටිය, 2009.

රසල් බර්ට්‍රන්ට්, දර්ශනවාදයේ ගැටලු, පරිඃ රාජපක්ෂ සේනාරත්න, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල, 2008.

රාධාකෘෂ්ණන්, ඉන්දීය දර්ශනය, ෂ කාණ්ඩය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1970.

රාහුල හිමි අත්තුඩාවේ, බෞද්ධ දර්ශනය, දයාවංශ ජයකොඩි සමාගම, කොළඹ 10, 1963.

රාහුල හිමි හෙට්ටිමුල්ලේ, කාලය හා අවකාශයත බෞද්ධ මතය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්, සමන්ති පොත් ප්‍රකාශකයෝ, 2007.

විජේබණ්ඩාර චන්දිම, මොරටුවගම එච්. එම්, බෞද්ධ චින්තනය සහ ජයතිලක දෘෂ්ටිය, මහාචාර්ය කේ. එන්. ජයතිලක සමරු සංවිධානයේ ප්‍රකාශකයකි. රාජගිරිය, 1995.

විජේබණ්ඩාර චන්දිම, මොරටුවගම එච්. එම්, ආදී බෞද්ධ චින්තනය, අදහස් කිහිපයක්, එස්. ගොඩග් සහ සහෝදරයෝ, කොළඹ 10, 1985.

විජේරත්න ආනන්ද, ශ්‍රමණ සම්ප්‍රදාය (ෂඩ් ශාස්තෘවරුන් ඇතුළු බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්) කතෘ ප්‍රකාශනයකි, 2004.

වින්ටර්නිට්ස් එම්, ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය, 1 කාණ්ඩය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1967.

විමලධම්ම හිමි කන්දේගොඩ, ආචාරධර්ම, කර්තෘ ප්‍රකාශනයකි, 2009.

වීරසිංහ එස්. ජී. එම්, කාන්ටියානු දර්ශනය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්, කැලණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රකාශන මාලාව, කැලණිය, 1988.

සෙනෙවිරත්න සී. ඒ. දොන්, උපනිෂද්, සී.ස. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1961.

Keith A. Berridale, Budhist Philosophy; in Indian and Ceylon, munshirum manoharlal publishers, pvt, Ltd, 1979.

Matilal. Bimal Krishna, Perception; An Eassay on classical Indian theories of knowledge, Oxford, clarendon press, 1986.

Raadhaknishanan Sarvepalli, Moore A. Charles, A source Book in Indian philosophy, New Jersey, princton university press, 1957.

**ශාස්ත්‍රීය ලිපි:**

ජයතිලක කේ. එන්, බුදු සමය හා නූතන බටහිර දර්ශනය, දර්ශනවාදය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, දර්ශන සංගමයේ වාර්ෂික සංග්‍රහය, සංස්: මුතුගල ආතර්, ජයවීර කේ. පී., අතපත්තු පේමානන්ද, දර්ශන සංගමය, කැළණිය විශ්වවිද්‍යාලය, 1962 - 63, 2 කාණ්ඩය, 2 කලාපය.

ජයවර්ධන කේ. බී, දාර්ශනික පදනමකින් ලෝකෝත්පත්තිය විවරණය කරන නාසදීය සූක්තය, විද්‍යෝදය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය, අතිපූජ්‍ය හෙයියන්තුඩුවේ ශ්‍රී දේවමිත්ත නාහිමි උපහාර කලාපය, සංස්: පියරතන හිමි, වැගම., ධම්මානන්ද හිමි මකුරුප්පේ, ඥානරතන හිමි පුස්සැල්ලාවේ, විද්‍යෝදය ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රකාශනයකි, කොළඹ 10, 2012.

තිලකරත්න අසංග, ඥානයෙහි අවාච්‍යත්වය පිළිබඳ ගැටලුව, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්: සෝමානන්ද හිමි තෙරිපැහැ, ධම්මපාල හිමි යටගම, සේනානායක ජී. එස්. බී, අදිකාරී අබයරත්න, විතානගේ සිරිසේන, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් ප්‍රකාශිත ය. 1999.

දනන්සූරිය ජිනදාස, රෙනේ දේකාත් චරිතාපදානය, සම්භාෂා, සංස්: අධිකාරී, ඒ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 1993.

විමලධම්ම හිමි කන්දේගොඩ, ඉමැනුවෙල් කාන්ට්ගේ ඥාන විභාගය, ඉඳුවර, මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය හරසරණිය, සංස්: අමරසේකර දයා, ධීරානන්ද හිමි, හඟුරන්කෙත, දිසානායක රෝහිත, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2004.

විමලසාර හිමි නෙළුම් දණ්ඩේ, බුද්ධකාලීන ඥාන මාර්ග, මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය, 92, සංස්: ධීරානන්ද මොල්ලිගොඩ, මහින්ද කොබවක, පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 1992.

වීරවර්ධන සුමේධ, රෙනේ ඩේකාර්ට් නූතන බටහිර දර්ශනයේ පියා වශයෙන් සැලකිය හැකිද? චරණ මංගල කලාපය, සංස්: පඤ්ඤාරතන හිමි මඩවලතැන්නේ, චන්ද්‍රවිමල හිමි කට්ටකඩුවේ, ප්‍රකාශනය, භික්ෂු සංගමය, ශ්‍රී ජඩපුර විශ්වවිද්‍යාලය, 2008.

සෙනෙවිරත්න ජයන්ත, විට්ගන්ස්ටෛන්ගේ මුල් දාර්ශනික සංකල්පය පිළිබඳ විග්‍රහයක්, සම්භාෂා 9, ප්‍රධාන සංස්: රත්නපාල පී.ඩී. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි, බත්තරමුල්ල, 1998.



**කෝෂ ග්‍රන්ථ:**

සිංහල විශ්ව කෝෂය, වෙළුම් - I, II, III, IV, ප්‍රධාන සංස්: ඩී.ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1963.

බුද්ධදත්ත හිමි පොල්ලත්තේ, පාලි, සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවෙල, 1998.

මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්දකෝෂය, සී/ස, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11, 1999.

ලියනගේ සිරි, බෞද්ධ ශබ්ද කෝෂය I, II, කර්තෘ ප්‍රකාශනයකි, 2001.

සිංහල ශබ්ද කෝෂය, 25 කාණ්ඩය, 45 භාගය, II කොටස, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1992.

සිරි සුමංගල ස්ථවිර මඩිතියවෙල, පාලි - සිංහල ශබ්ද කෝෂය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1956.

Edited by: Davids Rhys, stede William, The pali text society's, Pali English Dictionary, Luzac and company, ltd. London, 1966.

Malasekara G.P., Doctonary of Pali - Proper names vol - I Manshiram manoharlal publishers, pvt. Ltd, New Delhi, 1983.

Premasiri P. D, skepticism, Editor in chief, G.P. Malasekara, editor chief, W.G. Weerarathne,Encyclopedia of Buddhism, vol VII, Department of Buddhist affirs, Ministry of Religious Affairs, Sri Lanka, 2007.